වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය

# සී/ස ලංකා නැව් සංස්ථාව (CSC)

# ලංසු කැඳවීම (IFB)

## ලක් විජය බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහනය කරන පුත්තලම වරායේ නැංගුරම් ලා ඇති නැව්වලට යාමට සහ ඒමට ගමන් බෝට්ටු සේවා සැපයීම.

**ජාතික තරගකාරීත්ව ලංසු කැඳවීම. (NCB)**
**ටෙන්ඩර අංකය : CSC/BT/2023/24**

සී/ස ලංකා නැව් සංස්ථාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් ලක් විජය බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහනය කරන පුත්තලම වරායේ නැංගුරම් ලා ඇති නැව්වලට යාමට සහ ඒමට ගමන් බෝට්ටු සේවා සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

**කොන්දේසි සහ නියමයන්:**

1. මෙම සේවාව අවශ්‍ය වන්නේ ගල් අඟුරු නිකුත් කරන 2023 සැප්තැම්බර් මැද භාගයේ සිට 2024 මැයි මස මැද භාගය වන තෙක් පමණි.
2. මෙහෙයුම්කරු අදාළ අධිකාරීන් තුළ ලියාපදිංචි ආයතනයක් විය යුතුය.
3. එකවර එක බෝට්ටුවක පුද්ගලයන් 10 දෙනෙකුට පහසුවෙන් ගමන් කිරීම සඳහා ආසන පහසුකම් තිබීම.
4. මගීන් රහිතව කි.ග්‍රෑ. 500-1000 ක පමණ භාණ්ඩ ගෙන යාමට ධාරිතාව සහිත වීම (ගෙන යා හැකි බරට අදාළ සහතික පත් ඉදිරිපත් කළ යුතුය.)
5. සියලුම මගීන්ට අනුමත ජීවිත ආරක්ෂක කබා/වැහි කබා සැපයිය යුතුය.
6. බෝට්ටු වැසි/අව්/මුහුදු ජල ආවරණයන් සහ ආරක්ෂක වැට සහිත වීම.
7. බෝට්ටු සහ පැදවුම්කරු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් අවසර ලබාගත යුතුය.
8. බෝට්ටු පැදවුම්කරුට පැදවීම පිළිබඳ පිළිගත් සහතිකයක් තිබීම.
9. මගීන් සහ කාර්ය මණ්ඩලය හා භාණ්ඩ සඳහා වලංගු මගී රක්ෂණ සහතික තිබිය යුතුය.
10. බෝට්ටු පැදවුම්කරු සහ සහායක යන දෙදෙනාටම පොලිස් වාර්තා තිබිය යුතුය.
11. ගල් අඟුරු ගොඩබාන කාල සීමාව තුළ ඕනෑම දිනක දිවා / රාත්‍රී කාලයේ (මුහුදු ස්වභාවය අගය 4 දක්වා) සේවා සැපයිය හැකි වීම හා අවශ්‍ය වූ විට නැව අසල රඳවා තිබිය යුතුය.
12. බෝට්ටුවලට අදාළ ජාත්‍යන්තර වර්ගීකරණ සංගම් සම්මේලනයේ සාමාජික සංගමයකින් ලබාගත් වලංගු මුහුදු ගමන් සඳහා යෝග්‍යතා සහතිකය හෝ වර්ගීකරණ සංගම් සහතිකය තිබිය යුතුය.
13. සාමාන්‍ය මුහුදු තත්ත්වයන් තුළ පැයකට නාවික සැතපුම් 12 ක් පමණ වේගයකින් පැදවිය හැකි විය යුතුය.
14. බෝට්ටුවල Flash lights, Compass, VHF සහ SOLAS අනුමත ප්‍රථමාධාර පහසුකම් තිබිය යුතුය.
15. මී 4-5 ක් පමණ වන ලක්විජය බලාගාර ජැටියේ ගැඹුරට සරිලන බෝට්ටු විය යුතුය.

සැපයුම් ලබා දෙනු ලබන බෝට්ටුවල මගීන් සහ භාණ්ඩ ආරක්ෂාකාරීව ලක්විජය බලාගාර ජැටියෙන් හෝ නොරොච්චෝල නාවික හමුද කඳවුරෙන් පටවාගැනීම සම්පූර්ණයෙන්ම මෙහෙයුම්කරුගේ වගකීම වේ.

උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට ලංකා නැව් සංස්ථාවේ නැව් කුලියට ගැනීමේ සහ නියෝජිත දෙපාර්තමේන්තුවෙන් වැඩි විස්තර ලබාගත හැකිය; ඊමේල්: **dantha@cscl.lk**; දුර: **071 021 5702** එමෙන්ම සතියේ දිනවල පහත දක්වා ඇති ලිපිනයේදී ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.

පහත දක්වා ඇති ලිපිනයට ලිඛිත අයදුම්පතක් යොමු කිරීමෙන් සහ **රු.10,000 ක (+15% වැට්, ශ්‍රී ලංකා රජය විසින් සිදු කළ හැකි වෙනස්කිරීම්වලට යටත්ව)** නැවත ගෙවනු නොලබන ගාස්තුවක් ගෙවීමෙන් සඳුදා සිට සිකුරාදා දක්වා වැඩ කරන දිනවල කාර්යාල වේලාවන්හිදී (පෙ.ව. 9.00 සිට ප.ව.3.00) සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය ලබාගත හැක.

**"බෝට්ටු සේවා සැපයීම සඳහා වූ ටෙන්ඩරය 2023/24"** ලෙස සලකුණු කරන ලද මුද්‍රා තැබූ ලංසු, ආපසු නොගෙවන තැන්පතුවේ ගෙවීම් පත්‍රිකාව සහ ඉහත සඳහන් අනෙකුත් අදාළ සාක්ෂි ලේඛන සමග ලියාපදිංචි තැපෑලෙන් (2023 අගෝස්තු 03 හෝ ඊට පෙර) එවිය යුතුය. නැතහොත් පහත සඳහන් ලිපිනයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

ලංසු භාරගැනීම **2023 අගෝස්තු 03** වැනි දින (ශ්‍රී ලංකා සම්මත වේලාවෙන්) **පැය 1500** ට අවසන් වන අතර, අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඕනෑම අවස්ථාවක ටෙන්ඩරය අවලංගු කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර ප්‍රසම්පාදන කමිටුව ගන්නා කිසිදු තීරණයක් සම්බන්ධයෙන් ලංසුකරුවන්ට දැනුම් දීමට බැඳී නොසිටී.

සැලකිය යුතු යි: සේවාව අවශ්‍ය කරන කාලය වන්නේ **2023 සැප්තැම්බර් මැද සිට 2024 මැයි මැද දක්වා ය** (ගල් අඟුරු ගොඩ බෑමේ කාලය)+/- සති 02, එමෙන්ම, අන්‍යෝන්‍ය එකඟතාවය මත තවත් වාරයන් දෙකක් සඳහා සේවා කාලය දීර්ඝ කිරීම සී/ස ලංකා නැව් සංස්ථාවේ පූර්ණ අභිමතය පරිදි සිදුවේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**සී/ස ලංකා නැව් සංස්ථාව,**
**අංක 27, MICH ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත,**
**කොළඹ 00100.**
**දුර: (011) 2328772/3, (011) 2423214, (011) 2497800**